# අල්පශ්‍රැතයෝ බහුශ්‍රැත කථා ඇසෙන විට ගැටෙති කෝප වෙති විරුද්ධ වෙති අසතුට පළ කරති

## දුක්කථා සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අංගුත්තර නිකාය 3 - පිටු අංක 294 - 299)

අල්පශ්‍රැතයා (නූගත් දැනුම නැති තැනැත්තා) බහුශ්‍රැතභාවය පිළිබඳ කථාව ඇසෙන විට ම කෝපයට පත්වෙයි. කිපෙයි. ව්‍යාපාදයට පැමිණෙයි. විරුද්ධ ව නැගී සිටියි. කෝපය, ද්වේෂය හා අසතුට පහළ කරයි.

ඒ කවර හෙයින් ද යත්;

තමා තුළ ඒ බහුශ්‍රැතභාවය නොදකියි. ඒ නිසා ප්‍රීතිය ප්‍රමෝදය නොලබයි.

එ හෙයින් අල්පශ්‍රැතයාට බහුශ්‍රැතභාවය පිළිබඳ කථා දුක් කථාය.